2561 - බෞද්ධ ධර්මාචාර්ය විභාගය - 2016 (2017)

(01) ථෙරවාදී බුද්ධ ධර්මයේ මූලික ඉගැන්වීම්

ලකුණු දීමේ පටිපාටිය

I කොටස සඳහා ලකුණු	-	**28**
II කොටස සඳහා ලකුණු	-	**72 (18 X 4)**
ලකුණු එකතුව	-	**100**

01 වන ප්‍රශ්නයේ i,ii,iii,iv,v කෙටි ප්‍රශ්නවලට දී ඇති පිළිතුරුවලට ලකුණු 02 බැගින් ද vi,vii,viii කෙටි ප්‍රශ්න සඳහා ලකුණු 03 බැගින් ද ix කෙටි ප්‍රශ්නය සඳහා ලකුණු 04 ක් ද x කෙටි ප්‍රශ්නය සඳහා ලකුණු 05 ක් ද හිමිවන බැවින් 01 ප්‍රශ්නයට මුළු ලකුණු 28 ක් හිමි වේ.

II කොටසේ ප්‍රශ්න අතුරින් තෝරාගත් ප්‍රශ්න 04 කට පිළිතුරු සැපයීම අවශ්‍ය ය. සෑම ප්‍රශ්නයක් ම කොටස් 03 කින් යුක්ත වේ.

i කොටසට ලකුණු 04 බැගින් ද

ii කොටසට ලකුණු 06 බැගින් ද

iii කොටසට ලකුණු 08 බැගින් ද හිමි වේ.

මේ අනුව එක් ප්‍රශ්නයකට ලකුණු 18 බැගින් ප්‍රශ්න 04 ට ලකුණු 72 ක් හිමි වේ.

I කොටස

01.

(i)

(අ) සමුදය සත්‍ය

(ආ) දුක්ඛ නිරෝධ ගාමිණී පටිපදා ආර්ය සත්‍ය

(එකකට එක බැගින් ලකුණු 02 යි)

(ii)

(අ) ඉද්ධිවිධ (ආ) දිබ්බසෝත

(ඉ) පරචිත්ත විජානන (ඊ) පුබ්බේ නිවාසානුස්සති

(උ) දිබ්බ චක්ඛු

(මේවායින් දෙසක් ලියා ඇත්නම්,
එකකට 01 ලකුණ බැගින් ලකුණු 02 යි)

Past Papers Wiki

(iii) අස්මිං සති ඉදං හෝති
ඉමස්ස උප්පාදා ඉදං උප්පජ්ජති
අස්මිං අසති ඉදං න හොති
ඉමස්ස නිරෝධා ඉදං නිරුජ්ඣති

(එක් කොටසකට ලකුණු භාගය බැගින් ලකුණු 02 යි,
සිංහලෙන් ලියා තිබුණ ද පිළිතුර නිවැරදි ලෙස සලකන්න)

(iv) මජ්ඣිම නිකායේ චක්කවත්ති සීහනාද සූත්‍රය

(ලකුණු 02 යි)

(v)

(අ) මිච්ඡාජීව (ආ) අධම්ම චරියා
(ඉ) අකුසල (ඊ) අසත්පුරිස

(එක් විරුද්ධාර්ථ පදයකට ලකුණු භාගය බැගින් ලකුණු 02 යි)

(vi)

- රාග
- දෝස
- මෝහ
- සද්ධා
- බුද්ධි
- විපස්සන

(එක් වරිතයක් දැන්වීමට ලකුණු 01 බැගින් ලකුණු 03 යි)

(vii)

- බුදු
- පසේ බුදු
- මහරහන්

(ලකුණු එක බැගින් ලකුණු 03 යි)

(viii)

- නෙක්ඛම්ම
- අව්‍යාපාද
- අවිහිංසා

(එකකට ලකුණු එක බැගින් ලකුණු 03 යි)

(ix)

- නූපන් අකුසල් නො ඉපදීම වීම.
- උපන් අකුසල් ප්‍රහාණය කිරීම.
- නූපන් කුසල් ඉපදවා ගැනීම.
- උපන් කුසල් වැඩි දියුණු කිරීම.

(ලකුණු 04 යි)

(x) ඉධ නන්දති පෙච්ච නන්දති
කත පුඤ්ඤෝ උභයත්ථ නන්දති
පුඤ්ඤං මේ කතන්ති නන්දති
භියෝ නන්දති සුග්ගතිං ගතෝ
කළ පින් ඇත්තා·මෙලොවත් සතුටු වෙයි, පරලොවත් සතුටු වෙයි. මා විසින් පින් කරන ලදැයි සතුටු වෙයි. සුගතියට ගියේ බෙහෙවින් සතුටු වෙයි.

(ගාථාවට ලකුණු 02 යි, තේරුමට ලකුණු 02 යි)

(මුළු ලකුණු 04 යි)

II කොටස

02.

(i)

1) බුද්ධානුස්සති
2) ධම්මානුස්සති
3) සංඝානුස්සති
4) සීලානුස්සති
5) චාගානුස්සති
6) දේවතානුස්සති
7) ආනාපානසති
8) මරණානස්සති
9) කායගතාසති
10) උපසමානස්සති

(මෙම අනුස්සති ධර්මයන්ගෙන් හතරක් ලියා ඇත්නම්,
එකකට එක ලකුණ බැගින් ලකුණු 04 යි)

PAST PAPERS WIKI

(ii)

- සමථ භාවනාව
- කාමච්ඡන්දාදී පංච නීවරණ නමින් හැඳින්වෙන අකුසල පහක් සමනය කර ගැනීමට ඉවහල්වන භාවනාවයි. (නීවරණානි සමථෙකීකි සමථෝ) සිත එක් අරමුණක පිහිටුවා ගැනීමෙන් කෙරෙන භාවනාවක් බැවින් මෙය චිත්ත භාවනා, සමාධි භාවනා යන නම්වලින් ද හැඳින්වෙයි.
- නැවත නැවත උපදනා සතිය හෙවත් සිහිය අනුස්සති නම් වෙයි.

(එක් පිළිතුරකට ලකුණු දෙක බැගින් ලකුණු 06 යි)

(iii) මහණෙනි, සියලු තන්හි සිහිය මනාව පිහිටුවාගත යුතුයයි මම දේශනා කරමි. මෙම දේශනාව අනුව යම් පුද්ගලයෙකු විසින් කමා යන එන විට, කන බොන විට, නිදාගන්නා විට, ගමන්කරන විට, අදාළ රැකියාවක් හෝ ඉගෙනීමක් කරන විට සිහිය මනාව පිහිටුවාගෙන කටයුතු කළයුතු බවයි. "සතිං උපට්ඨපෙත්වා" යනුවෙන් ද වදාළේ මෙයයි. සතියෙන් තොරව මේවා කරන විට දෝෂා රෝපණ, අලාභ ආදිය ඇතිවෙනවා පමණක් නොව තම ජීවිත පැවැත්මට ද හානිදායක තත්ත්වයක් උදාවෙයි. මෙවන් අදහස් පිළිතුරෙන් ප්‍රකාශ විය යුතුය. එබඳු පිළිතුරකට සම්පූර්ණ ලකුණු ප්‍රදානය කලහැක.

(ලකුණු 08 යි)

03.

(i)

(අ) ප්‍රාතිමෝක්ෂ සංවර ශීලය

(ආ) ඉන්ද්‍රිය සංවර ශීලය

(ඉ) ආජීව පාරිසුද්ධි ශීලය

(ඊ) ප්‍රත්‍ය සන්නිශ්‍රිත ශීලය

(එක් ශීලයක් දැක්වීමට ලකුණු 01 බැගින් ලකුණු 04 යි)

(ii) **ප්‍රාතිමෝක්ෂ සංවර ශීලය :** පාතිමොක්ඛ නැමැති විනය ග්‍රන්ථයේ සඳහන් ශික්ෂා පද සමූහය (227) ආරක්ෂා කිරීම.

ඉන්ද්‍රිය සංවර ශීලය : ඇස, කණ ආදී ස පැදැරුම් ඉන්ද්‍රියන් වැස, ශබ්ද ආදී අරමුණුවල ගැටීමෙන් කෙලෙස් උපදවා ගැනීමෙන් වැළකීම.



ශ්‍රී ලංකා
විභාග දෙපාර්තමේන්තුව



ලකුණු දීමේ පටිපාටිය

බෞද්ධ ධර්මාචාර්ය විභාගය 2017 (2018)

(01) ථෙරවාද බුද්ධ ධර්මයේ මූලික ඉගැන්වීම්

ඇගයීම් (ආයතනික විභාග) ශාඛාව,
ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව,
පැලවත්ත, බත්තරමුල්ල

මෙය උත්තරපත්‍ර පරීක්ෂකවරුන්ගේ ප්‍රයෝජනය සඳහා සකස් කෙරිණි. ප්‍රධාන පරීක්ෂක සාකච්ඡා පැවැත්වෙන අවස්ථාවේ දී ඉදිරිපත්වන අදහස් අනුව මෙහි වෙනස්කම් කරනු ලැබේ.

සියලු ම හිමිකම් ඇවිරිණි]
(முழுப் பதிப்புரிமையுடையது)
All Rights Reserved]

උත්තර පත්‍ර පරීක්ෂකවරුන් ගේ
ප්‍රයෝජනය සඳහා පමණි.

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව / இலங்கைப் பரீட்சைத் திணைக்களம் / Department of Examinations, Sri Lanka

2562 - බෞද්ධ ධර්මාචාර්ය විභාගය - 2017 (2018)

S 1

(01) ථෙරවාදී බුද්ධධර්මයේ මූලික ඉගැන්වීම්

පැ තුනයි

I කොටසේ ප්‍රශ්නය ද II කොටසින් තෝරාගත් තවත් ප්‍රශ්න හතරක් ද ඇතුළු ව ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සපයන්න.

සැ.යු. I කොටසේ ප්‍රශ්නයට පිළිතුරු මෙම ප්‍රශ්න පත්‍රයේ ම ලියා, II කොටසේ පිළිතුරු පත්‍රය සමඟ අමුණා භාරදෙන්න.

විභාග අංකය .....

I කොටස

1. (i) බුදුසමයට අනුව සියලු ම ධර්ම බෙදෙන කොටස් දෙක නම් කරන්න.

(අ) .....

(ආ) .....

(ලකුණු 02 යි)

(ii) ධම්මචක්කප්පවත්තන සූත්‍රයේ සඳහන් බැහැර කළ යුතු අන්ත දෙක දක්වන්න.

(අ) .....

(ආ) .....

(ලකුණු 02 යි)

(iii) පටිච්චසමුප්පාද ධර්මයේ එන නය ක්‍රම දෙක නම් කරන්න.

(අ) .....

(ආ) .....

(ලකුණු 02 යි)

(iv) ස්කන්ධ පංචකය බෙදිය හැකි කොටස් දෙක නම් කරන්න.

(අ) .....

(ආ) .....

(ලකුණු 02 යි)

(v) පරිනිර්වාණ ධාතු දෙක නම් කරන්න.

(අ) .....

(ආ) .....

(ලකුණු 02 යි)

[දෙවැනි පිටුව බලන්න.

(vi) තෙවැදෑරුම් වේදනා දක්වන්න.

.....

.....

.....

(ලකුණු 03 යි)

(vii) ත්‍රිලක්ෂණය නම් කරන්න.

.....

.....

.....

(ලකුණු 03 යි)

(viii) තුන්තරා බෝධිය නම් කරන්න.

.....

.....

.....

(ලකුණු 03 යි)

(ix) අප්පමාදඤ්ඤා හතර දක්වන්න.

.....

.....

.....

.....

(ලකුණු 04 යි)

(x) පහත සඳහන් ගාථා පාදය ඇතුළත් ගාථාව සම්පූර්ණ කර ලියන්න.

න කහාපණවස්සේන

.....

.....

.....

එම ගාථාවේ තේරුම දක්වන්න.

.....

.....

.....

.....

(ලකුණු 05 යි)

* *

සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව / இலங்கைப் பரீட்சைத் திணைக்களம் / Department of Examinations, Sri Lanka

33447

2562 - බෞද්ධ ධර්මාචාර්ය විභාගය - 2017 (2018) **S 1**

(01) ථෙරවාදී බුද්ධධර්මයේ මූලික ඉගැන්වීම්

ප්‍රශ්න හතරකට පමණක් පිළිතුරු සපයන්න.

II කොටස

2. (i) චතුරාර්ය සත්‍යය සම්බන්ධයෙන් අනුගමනය කළ යුතු කාර්ය එම සත්‍යවලට අදාළ වන පරිද්දෙන් දක්වන්න. *(ලකුණු 04 යි)*

(ii) දුක ඇතිවීමට හේතු වන ආර්ය සත්‍ය නම් කර, එහි ප්‍රභේද ද දක්වා, ඒවා හඳුන්වන්න. *(ලකුණු 06 යි)*

(iii) "නිර්වාණයත්, නිර්වාණගාමී ප්‍රතිපදාවත් අයත් වන්නේ චතුරාර්ය සත්‍යයට ම ය." මෙම ප්‍රකාශය ආර්ය සත්‍ය දේශනාව මඟින් පැහැදිලි කරන්න. *(ලකුණු 08 යි)*

3. (i) ආත්මවාදී ඉගැන්වීම්වලට අනුව පුද්ගලයා මරණයෙන් පසු උපදින ස්ථාන දක්වන්න. *(ලකුණු 04 යි)*

(ii) "ආත්මවාදී සංඥාව බැහැර කරන බුදුසමය දෘෂ්ටි කෝණ තුනකින් සත්ත්වයා පිළිබඳ යථාර්ථය ඉදිරිපත් කරයි." එම දෘෂ්ටි කෝණ තුන නම් කර, කෙටියෙන් පැහැදිලි කරන්න. *(ලකුණු 06 යි)*

(iii) "භෞතික ලෝකයේ ජීව-අජීව සියල්ල ම සෑදී ඇත්තේ භූත රූප සතර මුල් කරගෙන ය." එම භූත රූප දක්වා, ඒවායේ ස්වභාවය පෙන්වා දෙන්න. *(ලකුණු 08 යි)*

4. (i) බුදුරජාණන් වහන්සේ විසින් භාරතයේ පැවැති හේතුඵලවාදී ඉගැන්වීම් මූලික කොටස් හතරකට බෙදා, ඒවා ප්‍රතික්ෂේප කරන ලදි. ඒ කොටස් හතර නම් කරන්න. *(ලකුණු 04 යි)*

(ii) එකී වාදවලින් වාද දෙකක ස්වභාවය හඳුන්වා දෙන්න. *(ලකුණු 06 යි)*

(iii) පටිච්චසමුප්පාද ධර්මය දේශනා කිරීමේ මූලික අරමුණු දක්වා, මහාවග්ගපාළියේ සඳහන් වන පරිදි ද්වාදසාංග පටිච්චසමුප්පාදය ඉදිරිපත් කරන්න. *(ලකුණු 08 යි)*

5. (i) බුද්ධකාලීන අඩි ශාස්තෘවරුන් අතර කර්මවාදය හා පුබ්බේකත හේතුවාදය ප්‍රතික්ෂේප කළ ශාස්තෘවරුන් නම් කරන්න. *(ලකුණු 04 යි)*

(ii) "චේතනාවට මුල්තැන දී කර්මය විවරණය කිරීම බුදුසමයේ මූලික ලක්ෂණයකි." පැහැදිලි කරන්න. *(ලකුණු 06 යි)*

(iii) විපාක දෙන පිළිවෙළ අනුව කර්මයේ ප්‍රභේද දක්වා, ඒවායින් දෙකක් හඳුන්වන්න. *(ලකුණු 08 යි)*

6. (i) කුසලමූල හා අකුසලමූල නම් කරන්න. *(ලකුණු 04 යි)*

(ii) දස කුසල් දක්වා, ඒවා ද්වාරත්‍රයට බෙදා දක්වන්න. *(ලකුණු 06 යි)*

(iii) අම්බලට්ඨිකා රාහුලෝවාද සූත්‍රයේ දැක්වෙන කුසල-අකුසල විනිශ්චය කිරීමේ නිර්ණායක දක්වා, ඒවා කොසලකා හැරීම පුද්ගල හා සමාජ පරිහානියට හේතු වන බව පෙන්වා දෙන්න. *(ලකුණු 08 යි)*

7. (i) 'බෝධි' නමින් හැඳින්වෙන ලෝකෝත්තර මාර්ග ඥාන නම් කරන්න. *(ලකුණු 04 යි)*

(ii) ඉන්ද්‍රිය ධර්ම නම් කර, ඒවාට එම නම ව්‍යවහාර කිරීමේ හේතුව සැකෙවින් දක්වන්න. *(ලකුණු 06 යි)*

(iii) සතර සතිපට්ඨාන ධර්ම වැඩීමේ අනුසස් දක්වා, චිත්ත දමනය සඳහා චිත්තානුපස්සනාව පිහිට කර ගත හැකි ආකාරය පෙන්වා දෙන්න. *(ලකුණු 08 යි)*

8. (i) බුදුසමයේ දැක්වෙන ප්‍රධාන භාවනා ක්‍රම දෙක දක්වා, පඤ්ච අභිඥා හා අෂ්ට සමාපත්ති උපදවා ගත හැකි භාවනාව හඳුන්වන්න. *(ලකුණු 04 යි)*

(ii) භාවනාව සඳහා අරමුණු කර ගත යුතු දසකසිණ නම් කර, ඉන් දෙකක් සැකෙවින් හඳුන්වන්න. *(ලකුණු 06 යි)*

(iii) "මානසික දුර්වලතා බැහැර කොට, මානසික ශක්තීන් සංවර්ධනය කර ගැනීම නීවරණ ධර්ම බැහැර කිරීම මඟින් සිදු කර ගත හැකි ය." පැහැදිලි කරන්න. *(ලකුණු 08 යි)*

***

2562 බෞද්ධ ධර්මාචාර්ය විභාගය 2017 (2018)

(01) ථෙරවාදී බුද්ධ ධර්මයේ මූලික ඉගැන්වීම්.

ලකුණු දීමේ පටිපාටිය

I කොටස සඳහා ලකුණු	-	28
II කොටස සඳහා ලකුණු	-	72 (18×4)
ලකුණු එකතුව	-	100

I කොටසේ

I, II, III, IV, V ප්‍රශ්න සඳහා ලකුණු 2 බැගින්	10 යි.
VI, VII, VII ප්‍රශ්න සඳහා ලකුණු 3 බැගින්	09 යි.
IX ප්‍රශ්නය සඳහා ලකුණු	04 යි.
X ප්‍රශ්නය සඳහා ලකුණු	05 යි.
	28 යි.

II කොටසේ ප්‍රශ්න අතුරින් තෝරාගත් ප්‍රශ්න 04 කට පිළිතුරු සැපයීම අවශ්‍යය. සෑම ප්‍රශ්නයක් ම කොටස් 03කින් යුක්ත වේ.

i කොටසට ලකුණු 04 බැගින් ද,

ii කොටසට ලකුණු 06 බැගින් ද,

iii කොටසට ලකුණු 08 බැගින් ද, හිමි වේ.

මේ අනුව එක් ප්‍රශ්නයකට ලකුණු 18 බැගින් ප්‍රශ්න 04 ට **ලකුණු 72ක්** හිමි වේ.

01.

i. (අ) සංඛත හේතු ප්‍රත්‍ය බර්මයෙන් දෙකෙන් හටගත්

(ආ) අසංඛත

(එකකට ලකුණු 01 බැගින් ලකුණු 02යි.)

ii. (අ) කාමසුඛල්ලිකානුයෝගය

(ආ) අත්තකිලමතානුයෝගය

(එකකට ලකුණු 01 බැගින් ලකුණු 02යි.)

iii. (අ) අනුලෝම මුල සිට අග දක්වා

(ආ) පටිලෝම අග සිට මුල දක්වා

(එකකට ලකුණු 01 බැගින් ලකුණු 02යි.)

iv. (අ) නාම

(ආ) රූප

(එකකට ලකුණු 01 බැගින් ලකුණු 02යි.)

v. (අ) සෝපධිසේස නිබ්බාන ධාතු ක්ලේශ පරිත්‍යාගය

(ආ) අනුපධිසේස නිබ්බාන ධාතු සිතිවිය පරිත්‍යාගය

(එකකට ලකුණු 01 බැගින් ලකුණු 02යි.)

vii (අ) අනිත්‍ය (අනිත්‍ය)

(ආ දුක්ඛ

(ඉ) අනාත්ම (අනත්ම)

(එකකට ලකුණු 01 බැගින් ලකුණු 03යි.)

viii (අ) සුඛ වේදනා

(ආ) දුක්ඛ වේදනා

(ඉ) උපේක්ඛා වේදනා (අදුක්වම සුව)

(එකකට ලකුණු 01 බැගින් ලකුණු 03යි.)

viii. (අ) බුදු

(ආ) පසේබුදු

(ඉ) මහරහත්

(එකකට ලකුණු 01 බැගින් ලකුණු 03යි.)

ix. (අ) මෙත්තා

(ආ) කරුණා

(ඉ) මුදිතා

(උ) උපේක්ඛා

(එකකට ලකුණු 01 බැගින් ලකුණු 04යි.)

x.

" න කහාපණ වස්සේන - තිත්ති කාමේසු විජ්ජති
අප්පස්සාදා දුබා කාමා - ඉති විඤ්ඤාය පණ්ඩිතො" (ඔබ්දුර්ත ගාථාව කිහිය යුතුය)

" මිනිසාට කහවණු වැස්සකිනුත් කාමයන්හි තෘප්තියක් ඇතිනොවේ. මේ නිසා කාමයෝ සිහිනයෙන් පානය කළ පැනක් මෙන් මද ආශ්වාද ඇත්තෝය. බොහෝදුක් ඇත්තෝය. පණ්ඩිතයා නුවණින් දැනගත යුතුය".

ගාථාවට ලකුණු 02යි. තේරුමට ලකුණු 03යි.

(මුළු ලකුණු 05යි.)

II කොටස

02.

i. 1. දුක්ඛාර්ය සත්‍යය - පරිඤ්ඤෙය්‍ය (පිරිසද දැනගත යුතුය.)

2. දුක්ඛ සමුදයාර්ය සත්‍ය - පහාතබ්බ (ප්‍රහාණය කළ යුතුය.)

3. දුක්ඛ නිරෝධාර්ය සත්‍ය - සච්ඡිකාතබ්බ (සාක්ෂාත් කළ යුතුය.)

4. දුක්ඛ නිරෝධ ගාමිනි පටිපදා ආර්ය සත්‍යය - භාවේතබ්බ (වැඩිය යුතුය.)

(එකකට ලකුණු 01 බැගින් ලකුණු 04යි.)

ii. සමුදයාර්ය සත්‍යය. (1)

(2)
(අ) කාම තණ්හා - රූප ශබ්දාදි පංචකාම වස්තූන්හි ඇලීම් බැඳීම් ඇති කරගන්නා තණ්හාවයි.

(ආ) භව තණ්හා - රූප, අරූප භාවයන්හි ඇලීම හා ධ්‍යාන පිළිබඳ සියුම් ඇල්ම.

(ඉ) විභව තණ්හා - සත්ත්වයා මරණින් මතු යළි ඉපදීමෙන් මේ ජීවිතයෙන්ම අවසන් වන්නේය යන උච්ඡේද දෘෂ්ටිය සමඟ ඇතිවන තණ්හාව.

සත්‍යය දැක්වීමට ලකුණු 01යි. ප්‍රභේද තුන දැක්වීමට ලකුණු 02යි. පැහැදිලි කිරීමට එකකට ලකුණු එක බැගින් ලකුණු 03යි.

(1+2+3 = 06යි.)

1-0
2-1
3-2

Past Papers Wiki

iii. දුකින් මිදීම නිවනයි. එය අයත් වන්නේ නිරෝධ සත්‍යයටයි. එම දුකින් මිදීම සඳහා ක්‍රමික පිළිවෙතක යෙදිය යුතුය. ඒ පිළිවෙත් මග ආර්ය අෂ්ටාංගික මාර්ගයයි. නැතහොත් මධ්‍යම ප්‍රතිපදාවයි. එය අයත් වන්නේ දුක්ඛ නිරෝධ ගාමිනි පතිපදා මාර්ගයටයි. දුක නැති කිරීමත් සිදුකළ යුත්තේ දුකක් ඇති නිසාය. එය දුක්ඛ සත්‍යයයි. දුක ඇති වීමටද හේතුවක් තිබිය යුතුය. එය සමුදයයි. මේ අනුව නිර්වාණයත් නිර්වාණගාමී ප්‍රතිපදාවත් අයත් වන්නේ ප්‍රධාන වශයෙන්ම චතුරාර්ය සත්‍යය පදනම් කරගෙනය.

(මෙවැනි පැහැදිලි කිරීමක් කර ඇති පිළිතුරකට ලකුණු 08යි.)

03.

i. (අ) ස්වර්ගය

(ආ) නිරය

(එක් උපදින ස්ථානයක් දැක්වීමට ලකුණු 02යි.
ස්ථාන දෙකම දැක්වීමට ලකුණු 04යි.)

ii.

1. ස්කන්ධ
2. ධාතු
3. ආයතන

ස්කන්ධ - පුද්ගලයා, සත්ත්වයා බුදු දහම ගොඩවල් (බන්ධ) පහකට බෙදා දක්වා ඇත. එනම් රූප, වේදනා, සංඥා, සංඛාර, විඤ්ඤාණ. මේ පහ එකතු කොට පංචස්බන්ධයයි කියයි. මේ ස්කන්ධ පහ වෙන් වෙන් වශයෙන් ගෙන පරීක්ෂා කිරීමේදී සත්ත්වයෙක් නැත. ඇත්තේ සම්මුති මාත්‍රයක් පමණි. එසේම මේ ස්කන්ධ පහ රථයක අවයව වලට උපමා කරමින් පරමාර්ථික වශයෙන් සත්ත්වයෙකු නැතිබව දන්වා ඇත.

ආයතන - ආත්ම සංකල්පය ප්‍රත්‍යක්ෂ කරන බුදු සමය පුද්ගලයා ස්කන්ධ වශයෙන් පමණක් නොව තවදුරටත් ආයතන වශයෙන්ද බෙදා දක්වයි. මෙහිදී චක්ඛු ආදී දොරටු සයත්, රූපාදී අරමුණු හයත් එකතු කොට ආයතන නාමයෙන් හඳුන්වයි. මේ මඟින් චක්ඛු ආදී විඤ්ඤාණ සයත් ඒ හා සම්බන්ධ චෛතසිකත් පහළ වීමෙන් සත්ත්වයා අනන්ත සසර ගමන් කරවයි. සසර දුකට පත්කරයි. එසේ සසර ගමන් කරවීමට චිත්ත - චෛතසික ධර්ම උත්සහ ගන්නා නිසාත් ඒ අනුව සසර දිගින් දිගට ගමන් කරවන නිසාත් චක්ඛු ආදී දොළසට ආයතන නම ව්‍යවහාර කෙරේ.

ධාතු - ධාතු දහඅටකි. සත්ත්වයා විසින් චක්ඛු ආදිය උසුලන දරණ බැවින් ධාතු යන වචනය ධර්මයේ සඳහන් වෙයි. එසේම මේ ධාතූන් සත්ත්වයාට සසර දුක ඇති කරවන යන අර්ථයෙන් ධාතු වන බව කියැවේ. ආයතන වශයෙන් දොළසකට බෙදන ලද ඉන්ද්‍රිය හා ආරම්මණ වලට ඉන්ද්‍රිය විඥානය එක් කිරීමෙන් ධාතු දහඅටක් වෙයි. මෙම ධාතු විභාගයෙන් නිස්සත්ත නිජ්ජීව භාවයද ප්‍රකට කෙරේ.

නම් කිරීමකට එකකට එක ලකුණ බැගින් ලකුණු 03යි. හැඳින්වීමට එකකට එක ලකුණු බැගින් ලකුණු 03යි. (03+03=06)

iii. (1) පඨවි
(2) අපෝ
(3) තේජෝ
(4) වායෝ

පඨවි - මෘදු බව, තද බව, රළු බව ලක්ෂණ කොට ඇත්තේ පෘථිවියයි.
ආපෝ - වැගිරෙන ස්වභාවයෙන් යුක්ත වූයේ ආපෝ ධාතුවයි.
තේජෝ - උණුසුම් ස්වභාවය, දැවෙන ගතිය සිසිල් බව තේජෝ ධාතුවයි.
වායෝ - ඉන්ද්‍රිය සම්බන්ධ වූ හෝ නොවූ කොතැනක හෝ පවතින සැලෙන ගතිය, පිපෙන ගතිය වායෝ ධාතු නම්වේ.

නාම රූප දැක්වීමේදී එකකට ලකුණු එක බැගින් ලකුණු 04යි.

(4+4=08)

04.

i. (1) සයංකතං දුක්ඛං - සයංකත වාදය
(2) පරංකතං දුක්ඛං - පරංකත වාදය
(3) සයංකතං පරංකතං දුක්ඛං - සයංකත පරංකත වාදය
(4) අසංයංකාරං අපරංකාරං - අසයංකාර අපරංකාර වාදය

(එකකට එක ලකුණ බැගින් කරුණු හතරට ලකුණු 04යි.)

ii. **සයංකත වාදය** - හේතුව හා ඵලය අතර වෙනසක් දැක්විය නොහැකි බව ප්‍රකාශ කිරීම සයංකත වාදයයි.

පරංකත වාදය - හේතුව එකකි. ඵලය අනෙකකි. හේතුව හා ඵලය අතර සම්බන්ධයක් නැතැයි ඉගැන්වෙන්නේ පරංකත වාදයෙනි.

සයංකත පරංකත වාදය - සයංකත හා පරංකත වාද දෙකේම මිශ්‍රණයක් ලෙස මෙය හැඳින්විය හැකිය. හේතුවත් ඵලයත් එකකි. එමෙන්ම දෙකකි. හේතුව හා ඵලය අතරට සම්බන්ධයක් ඇත්තාක් මෙන්ම නැත්තේද වෙයි. අන්ත දෙකක් එකට සම්බන්ධකර ඇති බැවින් උභතෝවාදය ලෙසින්ද හැඳින්වෙයි.

අසංයංකාරං අපරංකාරං - හේතුඵල සම්බන්ධයකින් තොරව සියල්ල සිදුවන බව ප්‍රකාශකරන වාදය අසංකාර, අපරංකාර වාදයයි. බුද්ධකාලයේ විසූ මක්ඛලිගෝසාල වැනි අය මෙවැනි දුෂ්ටියක් ගත් අය වෙයි.

(එක් වාදයක් හැඳින්වීමට ලකුණු 03යි. වාද දෙකකට ලකුණු 06යි.)

iii. පටිච්ච සමුප්පාදය දේශනා කිරීමේදී මූලික අරමුණ වූයේ,

(1) සන්තානගත දුක

(2) සමාජගත දුක ඇතිවන ආකාරය විවරණය කිරීම.

(4)

සන්තානගත දුක හා සමාජගත දුක නැතිවන ආකාරය දැක්වීම.

අවිජ්ජා පච්චයා සංඛාරා, සංඛාර පච්චයා විඤ්ඤාණං, විඤ්ඤාණ පච්චයා නාමරූපං, නාමරූපං පච්චයා සළායතනං, සළායතන පච්චයා ඵස්ව පච්චයං, ඵස්ස පච්චයා වේදනා , වේදනා පච්චයා තණ්හා, තණ්හා පච්චයා උපාදානං, උපාදාන පච්චයා භවෝ, භව පච්චයා ජාති, ජාති පච්චයා ජරා මරණං, ජරා මරණ සෝක පරිදේව දුක්ඛ දෝමනස්සුපායාසා සම්භවන්ති. ඒව මේතස්ස කේවලස්ස දුක්ඛක්ඛන්ධස්ස සමුදයෝ හෝති.

(අරමුණු දැක්වීමට ලකුණු 04යි. පටිච්ච සමුප්පාද දේශනා දැක්වීමට ලකුණු 04යි. 04+04=08යි.)

05.

i. (1) පූර්ණ කස්සප

(2) අජිත කේසකම්බලි

(3) මක්ඛලි ගෝසාල

යන මේ අය කර්මය ප්‍රතික්ෂේප කළ අය වෙති.

(4) ජෛන මහාවීර තුමා ප්‍රබ්බේකත හේතු වාදය ප්‍රතික්ෂේප කළ අය වෙයි.

(එක් ශාස්තෘවරයෙකු හැඳින්වීමට ලකුණු 01යි. හතරදෙනාම දැක්වීමට ලකුණු 04යි.)

ii. නිබ්බේධික පරියාය, චුල්ලකම්ම විභංග වැනි සූත්‍ර වලට අනුව බුදුරජාණන් වහන්සේ චේතනාවට මුල්තැන දී කර්මය විවරණය කළහ. **චේතනාහං භික්ඛවේ කම්මං වදාමි, යං චේතයිත්වා කම්මං කරෝති. කායෙනවා වාචාය වා මනසාය වා.** මෙයින් කියවෙන්නේ කර්මය සචේතනික බවයි. තිදොරින් කරන ක්‍රියා කුසල අකුසල වශයෙන් නම් කෙරේ. ලෝභ - දෝස - මෝහ මුල් වීමෙන් අකුසල චේතනාද අලෝභ - අදෝස - අමෝහ මුල්වීමෙන් කුසල චේතනාද පහළ වෙයි.

(මේ කරුණු ඇසුරු කරගනිමින් ලියාඇති පිළිතුරට ලකුණු 06ක් පිරිනමන්න)

iii. (4)
(1) ගරුක කර්ම
(2) ආසන්න කර්ම
(3) ආචිණ්ණ කර්ම
(4) කටත්තා කර්ම

ගරුක කර්ම - බලවත් වූ කුසල කර්ම හා අකුසල කර්ම ගරුක කර්ම නම්වේ. රූපාවචර, අරූපාවචර ධ්‍යාන ලබා ඒවායින් නොපිරිහී මියගිය විට උපතක් ලබයි ද කුසල පක්ෂයේ ගරුක කර්මයි. පංචානන්තරිය කර්ම සිදුකර අපායේ උපන්විට එය ගරුක අකුසල කර්මයි.

ආසන්න කර්ම - මරණයට ආසන්න අවස්ථාවේදි සිදුකළා වූ හෝ කලින් සිදුකරන ලදුව මරණාසන්න අවස්ථාවේදි නැගුණාවූ කුසල අකුසල කර්ම ආසන්න කර්ම නම් වේ.

ආචිණ්ණ කර්ම - කලක් මුළුල්ලේම පුරුදු කරන ලද හෝ නිරන්තරයෙන් සිහිකරන ලද කුසල කර්ම ආචිණ්ණ කර්ම නම්වේ. ගරුක කර්මය හෝ ආසන්න කර්මයක් නැති විට ආචිණ්ණ කර්මයක් විපාක දීම ස්වභාවයයි.

කටත්තා කර්ම - බලවත් චේතනා ශක්තියකින් තොරව සිදුකරන ලද කුසලාකුසල කර්ම කටත්තා කර්ම නම් වේ. ඇත්තේ ක්‍රියාමාත්‍රයක් පමණි. ප්‍රතිසන්ධියක් ලබා දීමට තරම් ශක්තියක් නැති දුර්වල කර්මයි. ගරුක, ආසන්න, ආචිණ්ණ කර්ම ඉදිරිපත් නොවන අවසථාවලදී මෙවැනි කර්ම වල ප්‍රවෘත්ති විපාක ලැබේ.

(කර්ම හතර දැක්වීමට ලකුණු 08යි. දෙකක් විස්තර කිරීමට එකකට ලකුණු දෙක බැගින් ලකුණු 04යි.)

06.

i. **කුසල මූල**

(1) අලෝභ

(2) අදෝස ②

(3) අමෝහ

අකුසල මූල

(1) ලෝභ

(2) දෝස ②

(3) මෝහ

(කුසල මූල දැක්වීමට ලකුණු 02යි. අකුසල මූල දැක්වීමට ලකුණු 02යි. මුළු ලකුණු 04යි.)

ii. ප්‍රාණඝාතයෙන් වැළකීම.

අදත්තාදානයෙන් වැළකීම. ②

කාමමිථ්‍යාචාරයෙන් වැළකීම.

මේවා කයින් සිදුවන ක්‍රියා වේ.

බොරු කීමෙන් වැළකීම.

කේළාම් කීමෙන් වැළකීම. ①

හිස් වචන කීමෙන් වැළකීම. ②

නපුරු වචන කීමෙන් වැළකීම.

මේවා වචනයෙන් සිදුවන ක්‍රියා වේ.

අභිධ්‍යා

② ව්‍යාපාද

මිථ්‍යා දෘෂ්ටිය යන මේවායින් වැළකීම සිතින් සිදුවන ක්‍රියා වේ.

(එක් ද්වාරයකින් සිදුවන වැළකීම් වලට ලකුණු 02යි.

ද්වාරනයට ලකුණු 06යි.)

iii. (1) තමන් මුල් කරගෙන (අත්තව්‍යාධාය සාවත්තති)

(2) අනුන් මුල් කරගෙන (පරව්‍යාධාය සාවත්තති)

(3) තමන් හා අනුන් මුල්කරගෙන (උභයව්‍යාධාය සාවත්තති) (සමාන්‍ය ඉලි කරගෙන)

PAST PAPERS WIKI

පුද්ගලයා සාමාජය වී හා බැදුණු උභය පාර්ශවයට අයත් දියුණුව හෝ පරිහාණිය පවතින්නේ කරන්නා වූ ක්‍රියාදාමයන් මතය. යහපත් ක්‍රියාව වී සෑම පාර්ශවයක්ම ආරක්ෂා කරන්නාසේ අයහපත් ක්‍රියා වී සෑම පාර්ශවයක්ම විනාශය කරා යොමු කරවයි. හොඳ හෝ නරක තේරුම් නොගෙන කටයුතු කිරීම නිසා පුද්ගල හා සමාජ එකතුව ලෞකික ලෝකොත්තර උභය දියුණුවෙන්ම පරිහාණියට පත්වෙයි. (ලෞකික/ලෝකෝත්තර)

(මේ කරුණු සැලකිල්ලට ගෙන ලකුණු දෙන්න. කාරණා තුනට ලකුණු 03යි. පුද්ගල හා සමාජ පරිහාණිය දැක්වීමට ලකුණු 05යි. මුළු ලකුණු 08යි.)

07.

i. (1) සෝවාන් මාර්ග ඥානය. ✓

(2) සකෘදාගාමී මාර්ග ඥානය.

(3) අනාගාමී මාර්ග ඥානය.

(4) අරහත් මාර්ග ඥානය.

(එක් මාර්ග ඥානයක් දැක්වීමට ලකුණු 01 බැගින් ලකුණු 04යි.)

ii. (1) සද්ධින්ද්‍රිය

(2) විරියින්ද්‍රිය

(3) සතින්ද්‍රිය

(4) සමාධින්ද්‍රිය

(5) පඤ්ඤින්ද්‍රිය

නාම රූප ධර්මයන්ගේ අධිපති බව පවත්වන්නා වූ ධර්ම ඉන්ද්‍රිය නමින් හඳුන්වනු ලැබේ. අධිපතිබව නම් අන්‍යධර්මයන් තමාට අනුකූල කරවා ගැනීමයි.

(ඉන්ද්‍රිය ධර්ම දැක්වීමේදී එකකට ලකුණු එක බැගින් ලකුණු 05 යි. එම අධිපති නව 01 06 ව්‍යවහාර කිරීමේ හේතුව දැක්වීමට ලකුණු 03යි. මුළු ලකුණු 08යි.)

iii. (1) සත්ත්වයන්ගේ පිරිසිදු වීම පිණිස.

(2) ශෝක පරිදේවයන් ඉක්මවීම පිණිස.

(3) දුක්දොම්නස් දුරලීම පිණිස.

(4) ආර්ය මාර්ගයට පිවිසීම පිණිස.

(5) නිවන් ප්‍රත්‍යක්ෂ කිරීම පිණිස. නිබ්බානසච්ඡ සම්මා කිරියාය.

සිත අනුව බලමින් භාවනා කිරීම චිත්තානුපස්සනාවයි. විවිධ අරමුණු කරා ගමන් කරන සිත මෙම චිත්තානුපස්සනාව මඟින් එක අරමුණක පිහිටුවා ගැනීමට පුළුවනි. චිත්ත ප්‍රභේද වල එන සරාග, සදෝස, සමෝහ අසමාහිත ප්‍රභේද නිදසුන් කරගනිමින් සිත පිහිටුවා ගන්නා ආකාරය පෙන්වා දීම ප්‍රමාණවත්ය.

(එකකට ලකුණු එක බැගින් ලකුණු 05යි. සිත පිහිටුවා ගැනීම පැහැදිලි කිරීමට ලකුණු 03යි. මුළු ලකුණු 08යි.)

08.

i. (1) සමථ භාවනාව. (සමාධි / විමුක්ති)

(2) විදර්ශනා භාවනාව.

මේ ක්‍රම දෙකෙන් පංච අභිඥාන සහ අෂ්ට සමාපත්ති උපදවා ගන්නා වූ භාවනාව සමථ භාවනාවයි.

(භාවනා ක්‍රම දෙකට ලකුණු 01 බැගින් ලකුණු 02යි. පංච අභිඥා හා අෂ්ට සමාපත්ති උපදවා ගන්නා වූ භාවනාවට ලකුණු 2යි. මුළු ලකුණු 04යි.)

ii. **කර්මස්ථාන (කමටහන්)**

(1) පඨවී කසිණය
(2) ආපෝ කසිණය
(3) තේජෝ කසිණය
(4) වායෝ කසිණය
(5) නීල කසිණය
(6) පීත කසිණය
(7) ලෝහිත කසිණය
(8) ඕදාත කසිණය
(9) ආකාස කසිණය
(10) ආලෝක කසිණය

(3) → 1
(5) → 2
(7) → 3
(8) → 4
(10) → 5

(භාවනා ඇරමුණු දැක්වීමට ලකුණු 01යි. කසිණ දැක්වීමට එකකට ලකුණු $\frac{1}{2}$ බැගින් ලකුණු 05යි.මුළු ලකුණු 06යි.)

iii. පංච නීවරණ නම් කරමින් එම නීවරණ ධර්මයන්හි අන්තර්ගත දුර්වලතා ඔස්සේ විවිධ ආශාවන්, වෛරයන්, සැකයන් නැතිකර සිත ශක්තිමත් කර ගැනීම පිළිතුරෙන් අපේක්ෂා කෙරේ.

(නීවරණ ධර්ම නම් කිරීමට ලකුණු 02ක්ද, දුර්වලතා ශක්තීන් දැක්වීමට ලකුණු 06ක්ද දෙන්න. මුළු ලකුණු 08යි.)

නීවරණ ධර්ම (3) → (1) / (4) → (2) / (5) → (3)

විචිකාරයට (5)

****

රහස්‍යයි

ඇගයීම් ශාලාවෙන් පිටතට රැගෙන යාම තහනම්

2563 - බෞද්ධ ධර්මාචාර්ය විභාගය -

2018 (2019)

- ලකුණු දීමේ පටිපාටිය -



(01) ථේරවාදී බුද්ධ ධර්මයේ මූලික ඉගැන්වීම්

පරීක්ෂකවරයාගේ නම :- ..

සංකේත අංකය :- **91/2/4/10/2019/01/S/.....**

මෙය උත්තරපත්‍ර පරීක්ෂකවරුන්ගේ ප්‍රයෝජනය සඳහා සකස් කෙරිණි. පරීක්ෂක සාකච්ඡා පැවැත්වෙන අවස්ථාවේ දී ඉදිරිපත්වන අදහස් අනුව මෙහි වෙනස්කම් කරනු ලැබේ.

ඇගයීම් (ආයතනික විභාග) ශාඛාව

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව

පැලවත්ත, බත්තරමුල්ල

අවසන් සංශෝධන ඇතුළත් කළ යුතුව ඇත. සියලුම හිමිකම් ඇවිරිණි.

සියලු ම හිමිකම් ඇවිරිණි]
முழுப் பதிப்புரிமையுடையது]
All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව / இலங்கைப் பரீட்சைத் திணைக்களம் / Department of Examinations, Sri Lanka

2563 - බෞද්ධ ධර්මාචාර්ය විභාගය - 2018 (2019)

S 1

පෑ තුනයි

(01) ථෙරවාදී බුද්ධධර්මයේ මූලික ඉගැන්වීම්

I කොටසේ ප්‍රශ්නය ද II කොටසින් තෝරාගත් තවත් ප්‍රශ්න හතරක් ද ඇතුළු ව ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සපයන්න.
සැ.යු. I කොටසේ ප්‍රශ්නයට පිළිතුරු මෙම පත්‍රයේ ම ලියා, II කොටසේ පිළිතුරු සමඟ අමුණා භාරදෙන්න.

විභාග අංකය .....

I කොටස

1. (i) ත්‍රිශික්ෂාවට අයත් තුන්වැනි ශික්ෂාව ලියන්න. එයට අදාළ මාර්ගාංග දක්වන්න. *(ලකුණු 02 යි)*

.....

.....

(ii) දුක දෙවියන්ගේ කැමැත්තට අනුව සිදුවන්නක් බව ප්‍රකාශ කළ ප්‍රාග් බෞද්ධ මතවාදය නම් කරන්න. *(ලකුණු 02 යි)*

.....

(iii) නියාම ධර්මවලින් හතරක් දක්වන්න. *(ලකුණු 02 යි)*

(අ) .....

(ආ) .....

(ඉ) .....

(ඊ) .....

(iv) 'සුඛා විරාගා ලොකෙ' මෙම පාලි පාඨයෙහි තේරුම ලියන්න. *(ලකුණු 02 යි)*

.....

(v) අභිධ්‍යා හා ව්‍යාපාද යන අකුසල ධර්මයන්හි වෙනස දක්වන්න. *(ලකුණු 02 යි)*

.....

.....

(vi) සංස්කාරයන්ගේ ලක්ෂණ තුන නම් කරන්න. *(ලකුණු 03 යි)*

(අ) .....

(ආ) .....

(ඉ) .....

[දෙවැනි පිටුව බලන්න.

(vii) ත්‍රිවිධ තණ්හාවන් දක්වන්න. *(ලකුණු 03 යි)*

(අ) .....

(ආ) .....

(ඉ) .....

(viii) සප්ත විශුද්ධි ධර්මයන්ගෙන් හතරක් නම් කරන්න. *(ලකුණු 04 යි)*

(අ) .....

(ආ) .....

(ඉ) .....

(ඊ) .....

(ix) විපාක දෙන පිළිවෙළ අනුව කර්මය කොටස් හතරකට බෙදේ. ඒවා දක්වන්න. *(ලකුණු 04 යි)*

(අ) .....

(ආ) .....

(ඉ) .....

(ඊ) .....

(x) පහත සඳහන් ගාථාව සම්පූර්ණ කරන්න.

පුඤ්ඤං චෙ පුරිසෝ කයිරා *(ලකුණු 02 යි)*

.....

.....

.....

එහි තේරුම ද ලියන්න. *(ලකුණු 02 යි)*

.....

.....

.....

.....

**

සියලු ම හිමිකම් ඇවිරිණි/முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව / இலங்கைப் பரீட்சைத் திணைக்களம் / Department of Examinations, Sri Lanka

2563 - බෞද්ධ ධර්මාචාර්ය විභාගය - 2018 (2019)

(01) ථෙරවාදී බුද්ධධර්මයේ මූලික ඉගැන්වීම

S 1

ප්‍රශ්න හතරකට පමණක් පිළිතුරු සපයන්න.

II කොටස

2. (i) බුදුරජාණන් වහන්සේ විවිධ අවස්ථාවල දී නොයෙක් සූත්‍ර දේශනා මඟින් දුක විස්තර කොට වදාළහ. එබඳු සූත්‍ර දෙකක් දක්වන්න. *(ලකුණු 04 යි)*

(ii) (අ) දුක්ඛාර්ය සත්‍යයෙහි දැක්වෙන තුන් වැදෑරුම් දුක් නම් කරන්න.

(ආ) ඒවා සැකෙවින් හඳුන්වන්න. *(ලකුණු 06 යි)*

(iii) "බුදුසමය ගැටලු නිරාකරණයට මග පෙන්වා දෙන දහමකි." චතුරාර්ය සත්‍යය ආශ්‍රයෙන් මෙම ප්‍රකාශයේ වැදගත්කම පහදා දෙන්න. *(ලකුණු 08 යි)*

3. (i) (අ) භාරතීය කර්ම සංකල්පයේ ආදිතම අවස්ථාව (යුගය) දක්වන්න.

(ආ) එම සංකල්පයේ දැක්වෙන සදාචාරය පාලනය කරන දෙවියාගේ නම ලියන්න. *(ලකුණු 04 යි)*

(ii) බුදුදහමේ කර්මයට අතිරේක ව කර්ම පථයක් ගැන ද ඉගැන්වෙයි. ඒ අනුව කර්මයේ හා කර්ම පථයේ වෙනස නිදසුනක් මඟින් පහදා දෙන්න. *(ලකුණු 06 යි)*

(iii) බුදුසමයට අනුව කර්මවාදය ඉගෙනීමෙන් සමාජයේ සිදුවන නොයෙකුත් අපරාධ මර්දනය කර ගැනීමටත් සුචරිතය සංවර්ධනය කර ගැනීමටත් හැකිය. මෙහි ඇති වැදගත්කම පෙන්වා දෙන්න. *(ලකුණු 08 යි)*

4. (i) දිට්ඨිය හා සම්මා දිට්ඨිය යන දෙකෙහි වෙනස පහදා දෙන්න. *(ලකුණු 04 යි)*

(ii) ආර්ය මාර්ගයෙහි ලා සම්මා දිට්ඨිය පූර්වංගම වන අයුරු පැහැදිලි කරන්න. *(ලකුණු 06 යි)*

(iii) ධාර්මික ජීවිතයක් ගොඩ නැගීම සඳහා සම්මා දිට්ඨිය ඉවහල් වන අයුරු විමසීමට ලක් කරන්න. *(ලකුණු 08 යි)*

5. (i) "තෘෂ්ණා ප්‍රත්‍යයෙන් උපාදානය වෙයි."

(අ) මෙහි 'උපාදාන' යන්නෙහි අර්ථය දක්වන්න.

(ආ) එබඳු උපාදාන දෙකක් නම් කරන්න. *(ලකුණු 04 යි)*

(ii) පටිච්චසමුප්පාද ධර්ම න්‍යාය ඇතුළත් කෙටි සූත්‍රය ලියා දක්වන්න. *(ලකුණු 06 යි)*

(iii) සමාජ හා ආර්ථික ගැටලු විශ්ලේෂණය කර විසඳුම් සපයා ගැනීම සඳහා පටිච්චසමුප්පාද දර්ශනය ඉවහල් කර ගත හැකි ආකාරය විමසීමට ලක් කරන්න. *(ලකුණු 08 යි)*

6. (i) රූපස්කන්ධයට අයත් රූප සියල්ල ප්‍රධාන ප්‍රභේද දෙකකින් යුක්ත ය. සංඛ්‍යා සමඟ එම ප්‍රභේද දෙක දක්වන්න. *(ලකුණු 04 යි)*

(ii) ස්කන්ධ පංචකයේ අස්ථිරබව ප්‍රකට කරමින් වදාළ උපමා පහ ඒ ඒ ස්කන්ධයන්ට අදාළ පරිද්දෙන් ඉදිරිපත් කරන්න. *(ලකුණු 06 යි)*

(iii) "සත්ත්වයා ස්කන්ධ පංචකය වරදවා තේරුම් ගැනීම නිසා සංසාරයේ දුක් විඳින බවත් එය විභාග කොට (පිරිසිඳ දැනීමෙන්) සසර තරණය කරන බවත් බුද්ධ දේශනාව යි." පහදන්න. *(ලකුණු 08 යි)*

7. (i) සමථ භාවනාව කෙටියෙන් හඳුන්වා දෙන්න. *(ලකුණු 04 යි)*

(ii) ආධ්‍යාත්මික වශයෙන් හා ලෞකික වශයෙන් සමථ භාවනාවෙන් ලද හැකි ප්‍රතිඵල කවරේ දැයි දක්වන්න. *(ලකුණු 06 යි)*

(iii) (අ) කමටහන් දීමේ දී සැලකිල්ලට ගෙන ඇති හැසිරීම් ස්වභාවය පදනම් කොට ගත් චරිත වර්ග හය දක්වන්න.

(ආ) එම චරිතයන්ගෙන් එකිනෙකට සමාන ව යෙදෙන චරිත වෙන් කොට පෙන්වා දෙන්න. *(ලකුණු 08 යි)*

8. (i) (අ) යථා භූත ඥාන දර්ශනය කෙටියෙන් හඳුන්වන්න.

(ආ) මෙමගින් ලෝකය හා සත්ත්වයා ගැන ලැබෙන අවබෝධය දක්වන්න. *(ලකුණු 04 යි)*

(ii) යථා භූත ඥාන දර්ශනය හා විදර්ශනාව අතර ඇති සම්බන්ධතාව පැහැදිලි කරන්න. *(ලකුණු 06 යි)*

(iii) "යථාභූත ඥාන දර්ශනය අනුව යමෙකු කටයුතු කරන්නේ නම්, ඔහුට තම උභයාර්ථය සලසා ගත හැකි ය." අදහස් දක්වන්න. *(ලකුණු 08 යි)*

* * *

Past Papers Wiki

2563 - බෞද්ධ ධර්මාචාර්ය විභාගය - 2018 (2019)

(01) ථෙරවාද බුද්ධධර්මයේ මූලික ඉගැන්වීම්.

ලකුණු බෙදීයාම

- I කොටසේ පළමු ප්‍රශ්නය ද, II කොටසින් තෝරාගත් ප්‍රශ්න හතරක් ද ඇතුළුව ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සැපයිය යුතු වේ.

I කොටස.

1. ප්‍රශ්නය

i. සිට v දක්වා ප්‍රශ්න සඳහා ලකුණු 02 බැගිනි.

vi. සහ vii ප්‍රශ්න සඳහා ලකුණු 03 බැගිනි.

viii. සහ ix ප්‍රශ්න සඳහා ලකුණු 04 බැගිනි.

x. වන ප්‍රශ්නය සඳහා ලකුණු 04යි.

(ලකුණු 28යි.)

II කොටස.

2. ප්‍රශ්නයේ සිට 8. ප්‍රශ්නය දක්වා

i. කොටස සඳහා ලකුණු 04යි.

ii. කොටස සඳහා ලකුණු 06යි.

iii. කොටස සඳහා ලකුණු 08යි.

(ලකුණු 18යි.)

- I කොටසට ලකුණු 28
- II කොටසට ලකුණු 4 x 18 72

PAST PAPERS WIKI

මුළු ලකුණු (28+72=100යි.)

D:\format\2019\Dinusha\mr rajapaksh\බෞද්ධ ධර්මාචාර්ය විභාගය\ලකුණු දීමේ පටිපාටි\(01) ථෙරවාද බුද්ධ ධර්මයේ මූලික ඉගැන්වීම්.docx

ලකුණු දීමේ පටිපාටිය

I කොටස

1.

i. ප්‍රඥා (පඤ්ඤා)
සම්මා දිට්ඨි, සම්මා සංකප්ප.

(එකකට ලකුණු 01 බැගින් ලකුණු 02යි.)

ii. ඊශ්වර නිර්මාණවාදය

(ලකුණු 02යි.)

iii. 1. උතු නියාම 2. බීජ නියාම 3. කම්ම නියාම 4. ධම්ම නියාම
5. චිත්ත නියාම

(එකකට ලකුණු $\frac{1}{2}$ බැගින් ලකුණු 02යි.)

iv. නොඇලුණු බව ලෝකයේ සැපයකි.

(එකකට ලකුණු 02යි.)

v. (අ) දැඩි ලෝභය
(ආ) අනුන් නැසේවා වැනසේවා යි ඇති කරගන්නා දුෂ්ට චේතනාව.

(එකකට ලකුණු 02යි.)

vi. 1. උප්පාද 2. ඨිති 3. භංග

(එකකට ලකුණු 01 බැගින් ලකුණු 03යි.)

vii. 1. කාම තණ්හා 2. භව තණ්හා 3. විභව තණ්හා

(එකකට ලකුණු 01 බැගින් ලකුණු 03යි.)

D:\format\2019\Dinusha\mr rajapaksh\බෞද්ධ ධර්මාචාර්ය විභාගය\ලකුණු දීමේ පටිපාටි\(01) පෙරවාද බුද්ධ ධර්මයේ මූලික ඉගැන්වීම්.docx

viii. 1. සීල විසුද්ධිය

2. චිත්ත විසුද්ධිය

3. දිට්ඨි විසුද්ධිය

4. කංඛා විතරණ විසුද්ධිය

5. මග්ගාමග්ග ඤාණදස්සන විසුද්ධිය

6. පටිපදා ඤාණදස්සන විසුද්ධිය

7. ඤාණදස්සන විසුද්ධිය

(එකකට ලකුණු 01 බැගින් හතරට ලකුණු 04යි.)

ix. 1. ගරුක කර්ම

2. ආසන්න කර්ම

3. ආචිණ්ණ කර්ම

4. කටත්තා කර්ම

(එකකට ලකුණු 01 බැගින් ලකුණු 04යි.)

x.

පුඤ්ඤං චෙ පුරිසෝ කයිරා
කයිරාථෙතං පුනප්පුනං
තම්හි ඡන්දං කයිරාථ
සුඛො පුඤ්ඤස්ස උච්චයො

ඉදින් යමෙක් පිනක් කළේ නම් ඒ නැවත නැවත ද කළ යුතුය. එහි සිත ඇලවිය යුතුය. පින් රැස් කිරීම සැපයට හේතු වේ.

(ගාථාවට ලකුණු 02යි. තේරුමට ලකුණු 02යි. ලකුණු 04යි.)

D:\format\2019\Dinusha\mr rajapaksh\බංද්ධ ධර්මාචාර්ය විභාගය\ලකුණු දීමේ පටිපාටි\(01) පෙරවාද බුද්ධ ධර්මයේ මූලික ඉගැන්වීම.docx

II කොටස

2.

i. ධම්මචක්කප්පවත්තන සූත්‍රය

මහාසතිපට්ඨාන සූත්‍රය

සච්චවිභංග සූත්‍රය

මෙම සූත්‍ර හා අදාළ වෙනත් සූත්‍ර ලියා ඇත්තේ නම් එකකට ලකුණු 02 බැගින් ලකුණු දෙන්න.

(ලකුණු 04යි.)

ii. (අ) දුක්ඛ දුක්ඛතා

විපරිණාම දුක්ඛතා

සංඛාර දුක්ඛතා

(අ) **දුක්ඛ දුක්ඛතා**

අමිහිරි අත්දැකීම්වලින් ඇතිවන සාමාන්‍ය දුක්.

විපරිණාම දුක්ඛතා

පුද්ගලයා හා සම්බන්ධ බාහිර වූ ද ආධ්‍යාත්මික වූ ද සියල්ල මොහොතින් මොහොත වෙනස්වන බව.

සංඛාර දුක්ඛතා

බුදුදහමට අනුව සත්ත්වයා, පුද්ගලයා, මම යන මේ නයින් ගන්නා ස්කන්ධ පංචකයට මොහොතින් මොහොත වෙනස්වන සුලු කායික මානසික ශක්තීන්ගේ සකස් වූවකි. මෙය වෙනස් වන ගතියෙක් යුක්ත වේ. එම වෙනස්වීම් ස්වභාවය නිසා ඇති වන්නා වූ දුක සංඛාර දුක්ඛ නමින් හඳුන්වයි.

(අ) යන්නේ සහ (ආ) යන්නේ එක් කරුණකට ලකුණු 01බැගින් කරුණු 03ට,

(ලකුණු 06යි.)

iii. චතුරාර්ය සත්‍යය තුළ අන්තර්ගත මූලධර්මය නම් දුකත්, දුකට හේතුවත්, සැපයත් සැපයට හේතුවත් යන මූලධර්මයකි. වෙනත් ලෙසකින් කිවහොත් මෙහි ඇත්තේ ද හේතුඵල දහම මුල්කොට ගත් ගැටලු විසඳීමේ න්‍යායයකි. චතුරාර්ය සත්‍ය දේශනාවේ දී දුක මුල්කොට ගත්ත ද මෙම මූලධර්මයට අනුව විග්‍රහ කළ හැකි බව විවරණය කර දැක්වෙන පිළිතුරක් අපේක්ෂිතය.

(ලකුණු 08යි.)

3.

i. (අ) වෛදික යුගය

(ආ) වරුණ දෙවියා

එක් නම් කිරීමකට ලකුණු 02 බැගින් දෙන්න

(ලකුණු 04යි.)

ii. චේතනාත්මක කායික, වාචසික, මානසික ක්‍රියා කර්ම නම් වෙයි. එම චේතනා මාත්‍රය ක්‍රියාත්මක වී සම්පූර්ණ වූ විට කර්ම පථයක් බවට පත් වේ. ගසක මල් හටගැනීම මිස ඵල හටගැනීමේ ශක්තියක් නැති නම් එය කර්මය හා සමාන වේ. ඵල හටගැනීමේ ශක්තියක් ඇති කරන්නේ නම් එය කර්ම පථය හා සමාන වේ.

කර්මය හා කර්ම පථය පැහැදිලි කිරීමට ලකුණු හතරක් ද නිදසුනට ලකුණු දෙකක් ද දෙන්න.

(ලකුණු 04 + 02 = 06 යි.)

iii. හොඳ - නරක, පින් - පව්, යහපත අයහපත කවරේ දැයි තේරුම් ගැනීමට කර්මය පිළිබඳව අවබෝධයක් තිබිය යුතුය. කර්මය පිළිබඳව ලියැවී ඇති සූත්‍ර ධර්ම හා බණ කථා සාහිත්‍යය කියවීමෙන් ඒ පිළිබඳ අවබෝධයක් ඇති කරගත් අය තම තමා විසින් කරනු ලබන අපරාධ අඩු කරගෙන සුචරිතය වර්ධනය කර ගැනීමට ගන්නා උත්සාහය පිළිතුරෙන් පෙන්වා දිය යුතුය.

(ලකුණු 08 යි.)

4.

i. දිට්ඨිය යන්නෙහි තේරුම දැකීම, දර්ශනය, යනුයි. ශාස්වත දෘෂ්ටි ආදි තන්හි යෙදී ඇති දිට්ඨි යන්නෙහි එම යෙදුම දැක්වේ. එහෙත් සම්මාදිට්ඨි යන්නෙන් යහපත් දැකීම නිවැරදි දැකීම යන අර්ථ ගෙන දේ. මෙවැනි විග්‍රහයක් පිළිතුරෙන් අපේක්ෂිතයි.

(ලකුණු 04යි.)

ii. ආර්ය අෂ්ටාංගික මාර්ගයෙහි පළමු වැන්න සම්මාදිට්ඨිය වන අතර ඉදිරි අංග සඳහා ද සම්මාදිට්ඨිය ම පෙරටු වෙයි. ඒ බව මජ්ඣිමනිකායේ මහාචත්තාරීස සූත්‍රයෙහි පැහැදිලිව ම දක්වා තිබේ. මෙවැනි විග්‍රහයක් පිළිතුරෙන් අපේක්ෂිතයි.

(ලකුණු 06යි.)

PAST PAPERS WIKI

iii. සම්මා දිට්ඨිය යනු නිවැරදි දැකීමයි. එදිනෙදා ජීවිතයේ දී තුන් දොරින් කරන ක්‍රියා තමාටත් අන්‍යයන්ටත් යහපත පිණිස පවතී ද අයහපත පිණිස පවතීද ආදී වශයෙන් සිතා යහපතට හේතුවන ක්‍රියා පිළිබඳ නිවැරදි සිහිය ඇතිව ක්‍රියා කිරීමෙන් ධාර්මික ජීවිතයක් ගොඩ නගා ගත හැකිය යන්න අවධාරණය විය යුතුය.

(ලකුණු 08යි.)

5.

i. (අ) දැඩි කොට අල්ලා ගැනීම උපාදාන නම් වේ.

(ආ) කාම උපාදාන - දිට්ඨි උපාදාන

සීලබ්බත උපාදාන - අත්තවාද උපාදාන

ලකුණු 01 බැගින් කාරණ හතරට

(ලකුණු 04යි.)

ii. ඉමස්මිං සති ඉදං හෝති - මෙය ඇති කල්හි මෙය වේ.

ඉමස්ස උප්පාදා ඉදං උප්පජ්ජති - මෙය ඉපදීමෙන් මෙය උපදී.

ඉමස්මිං අසති ඉදං න හෝති - මෙය නැති විට මෙය නොමැත.

ඉමස්ස නිරෝධා ඉදං නිරුජ්ඣති - මෙය නැති වීමෙන් මෙය නැති වේ.

(ලකුණු 06යි.)

iii. යම් ගැටලුවක් ප්‍රශ්නයක් ඇති වූ විට එහි මූලබීජ හේතුව සොයා ඊට පිළියම් යෙදීමෙන් ගැටලුව ප්‍රශ්නය විසඳා ගැනීමට හැකිවෙයි. ගෙදර දොර හෝ සමාජයේ හෝ යම් ආයතනයක ගැටලුවක් ඇති වූ විට මේ ක්‍රමයෙන් ගැටලුව විසඳාගත හැකිය යන්න අවධාරණය කරන පිළිතුරක් අපේක්ෂිතයි.

(ලකුණු 08යි.)

6.

i. මහාභූත රූප 04යි.

උපාදාය රූප 28යි.

(ඒකක ප්‍රභේද හා සංඛ්‍යා දැක්වීමට ලකුණු 02යි. කොටස් දෙකටම ලකුණු 04යි.)

ii. රූප ස්කන්ධය - පෙණ පිඬුවකට - නිසරුය

වේදනා ස්කන්ධය - දිය බුබුලකට - බිඳෙන සුළුය

සඤ්ඤා ස්කන්ධය - මිරිඟුවකට - රවටන සුවය

සංඛාර ස්කන්ධය - කෙසෙල් කඳකට - අරටුවක් නැති නිසා

විඤ්ඤාණ ස්කන්ධය - මායාවක් වැනිය - නැති දේ ඇති සැටියෙන් දැක්වීම.

(ලකුණු 06යි.)

iii. සත්ව, පුද්ගල සංකාව ඇති වන්නේ මමත්වය නිසාය. එහෙත් එම සත්ත්වයා හෝ පුද්ගලයා ස්කන්ධ පහක නිර්මාණයකි. එම නිර්මාණය කොටස් වශයෙන් බෙදා දැක්වීමේ දී එබඳු සත්ත්වයකු හෝ පුද්ගලයෙකු නොමැත. ඇත්තේ ස්කන්ධ සමවායයකි. මේ ආත්ම වශයෙන් ගැනීමේ දී දුක ඇතිවේ. ප්‍රඥාවෙන් විමසා බැලීමේ දී මමත්වයත් දුකත් නැතිකර සසර තරණය කළ හැකි බව පිළිතුරෙන් පැහැදිලි විය යුතුය.

(ලකුණු 08යි.)

7.

i. සමථ භාවනාව යනු ද චිත්ත භාවනාව යනු ද එකම භාවනා ක්‍රමයකි. සමථ භාවනාව පංචනීවරණ නමින් හැඳින්වෙන අකුසල ධර්ම සමනය කර ගැනීමට ඉවහල්වන භාවනාවයි. එම නීවරණ සංසිඳවා සිත තැන්පත් බවට පමුණුවා සිත දියුණු කරළීම මෙම භාවනාවෙන් සිදුවේ. පංචනීවරණ යටපත් කිරීම ද මෙයින් සිදුවන බව දක්වා තිබීම ද මෙම පිළිතුරෙන් අපේක්ෂිතය.

(ලකුණු 04යි.)

ii. ආධ්‍යාත්මික වශයෙන් ප්‍රථම ධ්‍යාන ආදී ධ්‍යාන උපදවා ගැනීම ඉක්මවා විදර්ශනා ප්‍රඥාව උපදවා ගැනීමට පසුබිම සකස් වන්නේ සමථ භාවනාවෙනි. මේ හැර සමථ භාවනාවෙන් සිත සන්සුන් කර ගැනීමට හැකිවීම, ඉගෙනීම් කටයුතු ආදියත් වෙනත් ක්‍රියාවලටත් සංයමයෙන් නිරවුල් මනසින් ක්‍රියාකාරීමට මෙම සමථ භාවනාව මග සලසයි. මෙවැනි පිළිතුරක් අපේක්ෂිතයි.

(ලකුණු 06යි.)

D:\format\2019\Dinusha\mr rajapaksh\බෞද්ධ ධර්මාචාර්ය විභාගය\ලකුණු දීමේ පටිපාටි\[01] ගෙරවාදී බුද්ධ ධර්මයේ මූලික ඉගැන්වීම්.docx

iii.

(අ) පුද්ගලයෙකුගේ විවිධ හැසිරීම් අනුව ගතිලක්ෂණ දැකගත හැකිය. ඒ අතුරෙන් බහුලව දක්නට ලැබෙන ගතිලක්ෂණ අනුව රාග චරිත, දෝස චරිත, මෝහ චරිත, සද්ධා චරිත, බුද්ධි චරිත, විතක්ක චරිත යයි චරිත වර්ග කෙරේ.

(ආ) රාග චරිතය තුළ පවත්නා චරිත ලක්ෂණ සද්ධා චරිතය තුළත්,

දෝස චරිතය තුළ පවත්නා චරිත ලක්ෂණ බුද්ධි චරිතය තුළත්,

මෝහ චරිතය තුළ දක්නට ලැබෙන ලක්ෂණ විතක්ක චරිතය තුළත් පෙන්නුම් කරයි.

කොටස් දෙකටම ලකුණු සමාන වේ. **(ලකුණු 08යි.)**

8.

i. (අ) අනිත්‍ය, දුක්ඛ, අනාත්ම.

(ආ) **අනිත්‍ය** - විශ්වගත සියලු සප්‍රාණික අප්‍රාණික දෙය මොහොතින් මොහොත වෙනස් වන බව.

දුක්ඛ - අනිත්‍යතාව නිසා සිදුවන ඉච්ඡාභංගයන් ආශ්‍රයෙන් ඇතිවන අමිහිරි විඳීම.

අනාත්ම - තමා අයත් නොවන්නක් බව.

(එක් කොටසකට ලකුණු 02 බැගින් ලකුණු 04යි.)

ii. පංචස්කන්ධය අනිත්‍යාදි වශයෙන් විශේෂ ආකාරයෙන් සලකා බැලීම විදර්ශනාවයි. වෙනත් ලෙසකින් එනම් ත්‍රිලක්ෂණය දැකීමයි. විදර්ශනා භාවනාවෙන් කෙරෙනුයේ යථාර්ථය අනිත්‍යාදි වශයෙන් දැකීමයි.

iii. මෙලොව හා පරලොව දියුණුව සලසා ගැනීම උභයාර්ථ දියුණුවයි. ත්‍රිලක්ෂණාවබෝධය තුළින් ගිහි හෝ පැවිදි කා හට වුවද මෙම කාර්ය සාධනය කර ගන්නට පුළුවන් වෙයි. පස්වග තවුසන්ගේ කතා පුවත මීට හොඳම නිදර්ශනයකි. තමා මෙන්ම තමා සතු සැප සම්පත් ආදියත් වෙනස් වන බවත්, එය දුකට පත්වීමක් බවත් ඒ නිසාම එය ආත්මීය වශයෙන් ගත යුතු නොවන බවත් පසක් කරගත් තැනැත්තා බුද්ධිමත්ව ක්‍රියා කරමින් ඇලීම් හා ගැටීම්වලින් තොරව ජීවිත ගමන සාර්ථක කරගනී.

ප්‍රශ්නයෙන් මෙවැනි පිළිතුරක් අපේක්ෂා කෙරේ.

(ලකුණු 08යි.)

- ***** -

Past Papers Wiki

රහස්‍ය යි

කරුණාකර මෙම ලකුණු දීමේ පටිපාටිය ඇගයීම් කාලාවෙන් පිටතට ගෙනයාමෙන් වලකින්න

2564 - බෞද්ධ ධර්මාචාර්ය විභාගය - 2019 (2022)

ලකුණු දීමේ පටිපාටිය



(01) ථෙරවාදී බුද්ධ ධර්මයේ මූලික ඉගැන්වීම්

පරීක්ෂකවරයාගේ නම :- .....

සංකේත අංකය :- 91/3/2/01/2022/01/S/.....

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
ආයතනික විභාග ඇගයීම් ශාඛාව
පැලවත්ත,
බත්තරමුල්ල.

PAST PAPERS WIKI

අවසන් සංශෝධන ඇතුළත් කළ යුතුව ඇත.

සියලුම හිමිකම් ඇවිරිණි.

සියලු ම හිමිකම් ඇවිරිණි]
முழுப் பதிப்புரிமையுடையது]
All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව / இலங்கைப் பரீட்சைத் திணைக்களம் / Department of Examinations, Sri Lanka

2564 - බෞද්ධ ධර්මාචාර්ය විභාගය - 2019 (2022)

S 1

(01) ථෙරවාදී බුද්ධ ධර්මයේ මූලික ඉගැන්වීම්

පැය තුනයි

අතිරේක කියවීම් කාලය - මිනිත්තු 10 යි.

I කොටසේ ප්‍රශ්නය ද II කොටසින් තෝරාගත් තවත් ප්‍රශ්න හතරක් ද ඇතුළු ව ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සපයන්න.

සැ.යු. I කොටසේ ප්‍රශ්නයට පිළිතුරු මෙම පත්‍රයේ ම ලියා, II කොටසේ පිළිතුරු සමඟ අමුණා භාරදෙන්න.

විභාග අංකය .....

I කොටස

1. (i) වාග් ද්වාරය පදනම් කරගත් චතුර්විධ කුසල ක්‍රියා දක්වන්න. *(ලකුණු 02 යි)*

(අ) .....

(ආ) .....

(ඉ) .....

(ඊ) .....

(ii) දුන් දෙයෙහි විපාක ඇත.
පිදීමෙහි විපාක ඇත.
සුසිරිත් දුසිරිත්හි විපාක ඇත.
මෙලොව ඇත. පරලොව ඇත.
මෙම අදහස් ප්‍රකාශවන මාර්ගාංගය දක්වන්න. *(ලකුණු 02 යි)*

.....

(iii) ආධ්‍යාත්මික ආයතන හා බාහිර ආයතන දෙක බැගින් දක්වන්න. *(ලකුණු 02 යි)*

(අ) .....

(ආ) .....

(ඉ) .....

(ඊ) .....

(iv) සේඛ, අසේඛ යනුවෙන් දක්වන උතුමෝ කවරහු ද? *(ලකුණු 02 යි)*

.....

(v) ද්වාදසාංග පටිච්ච සමුප්පාදයෙහි සඳහන් වන "අවිජ්ජා පච්චයා සංඛාරා" යන පාඨයෙහි සංඛාරා යනු කවරේදැයි දක්වන්න. *(ලකුණු 02 යි)*

.....

.....

[දෙවැනි පිටුව බලන්න.

උක්තාරී පත්‍ර
ප්‍රයෝජන

(vi) ජාති ප්‍රත්‍යයෙන් හටගන්නා ස්වාභාවික ලක්ෂණ තුනක් නම් කරන්න. *(ලකුණු 03 යි)*

(අ) .....

(ආ) .....

(ඉ) .....

(vii) අංගුත්තරනිකායේ නිබ්බේධික පරියාය සූත්‍රයෙහි කර්මය විපාක දෙන කාල තුනක් දක්වයි. ඒවා නම් කරන්න. *(ලකුණු 03 යි)*

(අ) .....

(ආ) .....

(ඉ) .....

(viii) අරිය, කල්‍යාණ, පුඤ්ඤ, සමචරියා මේවාට විරුද්ධ අකුසල පද දක්වන්න. *(ලකුණු 04 යි)*

(අ) .....

(ආ) .....

(ඉ) .....

(ඊ) .....

(ix) මහාසාවද්‍ය අකුසල කර්ම හතරක් සඳහන් කරන්න. *(ලකුණු 04 යි)*

(අ) .....

(ආ) .....

(ඉ) .....

(ඊ) .....

(x) පහත සඳහන් ගාථාව සම්පූර්ණ කරන්න.

සබ්බේ සංඛාරා අනිච්චාති *(ලකුණු 02 යි)*

.....

.....

.....

එහි තේරුම ද ලියන්න. *(ලකුණු 02 යි)*

.....

.....

.....

.....

**

සියලු ම හිමිකම් ඇවිරිණි/முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව / இலங்கைப் பரீட்சைத் திணைக்களம் / Department of Examinations, Sri Lanka

2564 - බෞද්ධ ධර්මාචාර්ය විභාගය - 2019 (2022)

(01) ථෙරවාදී බුද්ධ ධර්මයේ මූලික ඉගැන්වීම්

S 1

ප්‍රශ්න හතරකට පමණක් පිළිතුරු සපයන්න.

II කොටස

1. (i) (අ) සතර බ්‍රහ්ම විහාර ධර්ම නම් කරන්න.

(ආ) ඒවා අප්පමඤ්ඤා නාමයෙන් හැඳින්වීමට හේතු සාධක ඉදිරිපත් කරන්න. *(ලකුණු 04 යි)*

(ii) (අ) භාවනාවක් සඳහා උපයෝගී කර ගන්නා බ්‍රහ්ම විහරණය නම් කරන්න.

(ආ) එම භාවනාව වැඩීමෙන් ලද හැකි ආනිශංස **පහක්** පෙන්වා දෙන්න. *(ලකුණු 06 යි)*

(iii) "සියලු සත්ත්වයෝ සුවපත් වූ සිත් ඇත්තෝ වෙත්වා" (සබ්බේ සත්තා භවන්තු සුඛිතත්තා) මෙම දේශනා පාඨයෙන් සියලු සතුන් කෙරෙහි දැක්විය යුතු අපරිමිත මානසික සෙනෙහස වත්මන් මානව වර්ගයා කෙරෙහි දුරස්ථ වී තිබේ දැයි පහදා දෙන්න. *(ලකුණු 08 යි)*

2. (i) (අ) චතුරාර්ය සත්‍යයෙහි දැක්වෙන දෙවැදෑරුම් ඥාන නම් කරන්න.

(ආ) ඒවා කෙටියෙන් හඳුන්වන්න. *(ලකුණු 04 යි)*

(ii) (අ) හේතු ප්‍රත්‍ය ධර්මයන්ගෙන් හටගත් හා හටනොගත් ධර්ම හඳුන්වන නම් සඳහන් කරන්න.

(ආ) එම ධර්මයන්ගේ ස්වභාවය පැහැදිලි කරන්න. *(ලකුණු 06 යි)*

(iii) නිර්වාණගාමී ප්‍රතිපදාව මගින් ලෞකික ජීවිතය සාර්ථක කර නොගෙන ලෝකෝත්තර ජීවිතය සාර්ථක කර ගැනීම අපහසු වේ දැයි පෙන්වා දෙන්න. *(ලකුණු 08 යි)*

3. (i) බුදුදහම සත්ත්වයාගේ දුක ඇතිවන අන්දමත් දුකින් නිදහස්වන අන්දමත් හේතුඵලවාදීව පෙන්වා දී ඇත. එයට අදාළවන සංකල්ප දෙක නම් කරන්න. *(ලකුණු 04 යි)*

(ii) ඉහත (i) හි නම් කළ සංකල්ප සැකෙවින් හඳුන්වන්න. *(ලකුණු 06 යි)*

(iii) සැපය පිළිබඳ බෞද්ධ විග්‍රහය අවධානයට ලක් කරමින් නිවන පරම සැපය බව තහවුරු කරන්න. *(ලකුණු 08 යි)*

4. (i) ආත්මවාදය හා අනාත්මවාදය යන ඉගැන්වීම් දෙක හඳුන්වන්න. *(ලකුණු 04 යි)*

(ii) ස්කන්ධ පංචකය නම් කරන්න. *(ලකුණු 06 යි)*

(iii) ස්කන්ධ පංචකය නාම රූප වශයෙන් බෙදා දක්වන්න. *(ලකුණු 08 යි)*

5. (i) සත්තබොජ්ඣංග ධර්ම නම් කරන්න. *(ලකුණු 04 යි)*

(ii) සත්තබොජ්ඣංග ධර්මයන්ගෙන් භයක් කෙටියෙන් හඳුන්වන්න. *(ලකුණු 06 යි)*

(iii) "බොජ්ඣංග ධර්ම අගාරික, අනගාරික (ගිහි පැවිදි) දෙපාර්ශවයට ම වැඩිය හැකි ධර්ම පද්ධතියකි." මේ පිළිබඳව කරුණු ගෙනහැර දක්වන්න. *(ලකුණු 08 යි)*

6. (i) සංයෝජන ධර්ම නම් කරන්න. *(ලකුණු 04 යි)*

(ii) සංයෝජන ධර්ම තුනක් කෙටියෙන් හඳුන්වන්න. *(ලකුණු 06 යි)*

(iii) සතර ආර්යමාර්ග ඥානයන් පාදක කර ගනිමින් සත්ත්වයා භවබන්ධනයන්ගෙන් (සංයෝජනයන්ගෙන්) නිදහස් වන අයුරු පහදා දෙන්න. *(ලකුණු 08 යි)*

7. (i) (අ) ත්‍රිලක්ෂණය නම් කරන්න.

(ආ) එවා කෙටියෙන් හඳුන්වන්න. *(ලකුණු 04 යි)*

(ii) ත්‍රිලක්ෂණය මූලික කරගනිමින් වඩන භාවනාව බුදුදහම නම් කර ඇත්තේ කවර නමකින් දැයි සඳහන් කර ඊට හේතු පෙන්වා දෙන්න. *(ලකුණු 06 යි)*

(iii) "ත්‍රිලක්ෂණය පිළිබඳ ඉගැන්වීම් මගින් පුද්ගලයා තුළ වෙනස්වීම්වලට ඔරොත්තු දීමේ හැකියාව වර්ධනය කරයි." යන ප්‍රකාශය විග්‍රහ කරන්න. *(ලකුණු 08 යි)*

* * *

2564 - බෞද්ධ ධර්මාචාර්ය විභාගය - 2019 (2022)

(01) ථෙරවාදී බුද්ධ ධර්මයේ මූලික ඉගැන්වීම්

ලකුණු බෙදී යාම

I	කොටස සඳහා	ලකුණු	28
II	කොටස සඳහා	ලකුණු	72 (18 x 4)
	ලකුණු එකතුව		**100**

I කොටස

(i), (ii), (iii), (iv), (v) ප්‍රශ්න සඳහා ලකුණු 02 බැගින් — ලකුණු 10 යි

(vi), (vii) ප්‍රශ්න සඳහා ලකුණු 03 බැගින් — ලකුණු 06 යි

(viii), (ix), (x) ප්‍රශ්න සඳහා ලකුණු 4 බැගින් — ලකුණු 12 යි

II කොටසින් තෝරාගත් ප්‍රශ්න 04 කට පිළිතුරු සැපයීම අවශ්‍යය. සෑම ප්‍රශ්නයක් ම කොටස් 03 කින් යුක්ත වේ.

(i) කොටසට ලකුණු 04 බැගින් ද

(ii) කොටසට ලකුණු 06 බැගින් ද

(iii) කොටසට ලකුණු 08 බැගින් ද හිමි වේ.

මේ අනුව එක් ප්‍රශ්නයකට ලකුණු 18 බැගින් ප්‍රශ්න 04 ට ලකුණු 72 කි හිමි වේ.

පිළිතුරු

I - කොටස

01.

(i) (අ) බොරු කීමෙන් වැළකීම

(ආ) කේළාම් කීමෙන් වැළකීම

(ඉ) හිස් වචන කීමෙන් වැළකීම

(ඊ) පරුෂ වචන කීමෙන් වැළකීම

(පාලියෙන් හෝ ලියා ඇත්නම් ලකුණු දීම කරන්න.එකකට ලකුණු 1/2 බැගින් ලකුණු 02 යි)

(ii) සම්මා දිට්ඨිය **(ලකුණු 02 යි)**

(iii)

ආධ්‍යාත්මික ආයතන	බාහිර ආයතන
චක්ඛායතන	රූපායතන
සෝතායතන	සද්දායතන
ඝාණායතන	ගන්ධායතන
ජිව්හායතන	රසායතන
කායායතන	පොට්ඨබ්බායතන
මනායතන	ධම්මායතන

(එක් ආයතනයකට ලකුණු 1/2 බැගින් ආයතන හතරට ලකුණු 02 යි)

(iv) ආර්ය මාර්ගයෙහි හික්මීම ලබමින් සිටින තැනැත්තා සේඛ නම් වේ. හික්මීම ලබා අවසන් කළ තැනැත්තා අසේඛ නම් වේ.

(එක් හැඳින්වීමකට ලකුණු 01 බැගින් හැඳින්වීම් දෙකට ලකුණු 02 යි)

(v) කුසලාකුසල කර්ම සංඛාර නම් වේ. **(ලකුණු 02 යි)**

(vi) ජරා, මරණ, සෝක, පරිදේව, දුක්ඛ, දෝමනස්ස, උපායාස

(මේවායින් තුනක් ලියා ඇත්නම් එකකට ලකුණු 01 බැගින් ලකුණු 03 යි)

(vii) (අ) දිට්ඨධම්ම වේදනීය

(ආ) උපපජ්ජ වේදනීය

(ඉ) අපරාපරිය වේදනීය

(එක් කර්මයක් නම් කිරීමට ලකුණු 01 බැගින් ලකුණු 03 යි)

(viii) (අ) අරිය - අනරිය

(ආ) කල්‍යාණ - පාප

(ඉ) පුඤ්ඤ - පාප

(ඊ) සමචරියා - විසම චරියා

(විරුද්ධ එක් පදයකට ලකුණු 01 බැගින් පද හතරට ලකුණු 04 යි)

(ix)
- මව මැරීම
- පියා මැරීම
- සංඝ භේදය
- බුදුන්ගේ ඇඟේ ලේ සෙලවීම
- රහතුන් මැරීම

(එක් මහා සාවද්‍ය කර්මයකට ලකුණු 01 බැගින් ලකුණු 04 යි)

(x) (අ) සබ්බේ සංඛාරා අනිච්චාති - යදා පඤ්ඤාය පස්සති

අථ නිබ්බින්දති දුක්ඛේ - ඒස මග්ගෝ විසුද්ධියා

(ගාථාව සම්පූර්ණ කිරීමට ලකුණු 02 යි)

(ආ) සියලු සංස්කාර අනිත්‍යයයි යම් කලෙක විදසුන් නුවණින් දකින්නේ ද, එකල්හි නාමරූප ධර්ම සංඛ්‍යාත දුකෙහි කල කිරෙයි. මෙම කලකිරීම නිවනට මඟයි.

(ලකුණු 02 යි)

II - කොටස

01.

(i) (අ)

- මෙත්තා
- කරුණා
- මුදිතා
- උපෙක්ඛා

(එක් නම් කිරීමකට ලකුණු 1/2 බැගින් හතරට ලකුණු 02 යි)

(ආ) අප්‍රමාණ සත්වයන් කෙරෙහි පැතිර විය හැකි බැවින් අප්පමඤ්ඤා නම් වේ.

(ලකුණු 02 යි)

(ii) (අ) මෛත්‍රී භාවනාව වශයෙන් පුරුදු කෙරේ.

ගමන්නා **(ලකුණු 01 යි)**

(ආ)

සුවසේ නිදියයි	-	සුවසේ පිබිදෙයි.
නපුරු සිහින නොදකී.	-	මනුෂ්‍යයන්ට ප්‍රිය වෙයි
අමනුෂ්‍යයන්ට ප්‍රියවෙයි	-	දෙවියෝ රකිත්

ශරීරයට ගින්න වස විස ආදියෙන් පීඩාවක් නැත.

ඉක්මණින් සිත සමාධිවෙයි.	-	මුහුණ ප්‍රසන්න වෙයි.
නුමුළාව කළුරිය කරයි.	-	බ්‍රහ්ම ලොව උපදී

(එක් කරුණකට ලකුණු 01 බැගින් කරුණු පහට ලකුණු 05 යි)

(iii) අපා, දෙපා, සිවුපා ආදී සියලු සත්ත්ව වර්ගයා කෙරෙහි මෛත්‍රිය පැතිර යුතු බව බුද්ධ දේශනාවයි. එමඟින් තමා ඇතුළු සියලු දෙනා සුවපත් භාවයට පත් වීම ද දක්වයි. එහෙත් කුල , ප්‍රදේශ, ජාති රටවල් වශයෙන් වර්තමානයේ මානව වර්ගයා වෙන්වී බෙදී සිටිනා හෙයින් ද වෛරය, ක්‍රෝධය, හිංසාව වැනි මානසික ස්වභාවයන් ඔවුනොවුන් අතර, ඉස්මතු කරගන්නා හෙයින් ද න්‍යෂ්ටික අවි ආයුධ, වස විෂ පතුරුවා හරින හෙයින් ද එම මානසික සෙනහස මිනිස් සංහතියෙන් ගිලිහී ඇති බැවි පිළිතුරෙන් පෙන්වා දිය යුතු ය.

(ලකුණු 08 යි)

02.

(i) (අ) අනුබෝධ ඤාණය

පටිවේධ ඤාණය

(එකකට ලකුණු 01 බැගින් ලකුණු 02යි)

(ආ) අනුබෝධ ඤාණය යනු අනුමාන වශයෙන් ඇති කරගන්නා ඤාණයයි.

පටිවේධ ඤාණය යනු මාර්ගඵලවලට පැමිණ ප්‍රත්‍යක්ෂ වශයෙන් ලබා ගන්නා ඤාණයයි.

(ලකුණු 02 යි)

(ii) (අ) සංඛත/අසංඛත (2)

(ආ) හේතුඵල සම්බන්ධතාවයෙන් යුත් සේ සංඛත නම්, නොඋපන්, නොහටගත්, නොකරන ලද ප්‍රත්‍යයකින් යුත් දෙය අංඛත නම්.

(අන්න / අනත) **(ලකුණු 06 යි)**

(iii) නිර්වාණගාමී ප්‍රතිපදාව නම් ආර්ය අෂ්ටාංගික මාර්ගයයි. වය ශීල, සමාධි, ප්‍රඥා යන ත්‍රිවිධ ශික්ෂාවෙන් සම්පූර්ණ වෙයි. ලෞකික ජීවිතයේදී ද මෙමඟින් මනා හික්වීමක් ඇති කර ගත යුතු ය. සීලයෙන් කායික, වාචසික, සංවර බවක් ද සමාධියෙන් මානසික සංවර බවක්ද ප්‍රඥාවෙන් ජීවිතය පිළිබඳ යථාර්ථවත් බවක් ද ඇති තැනැත්තාට ලෝකෝත්තර ජීවිතය කරා පහසුවෙන් ගමන් කළ හැක.

පිළිතුරෙන් මේ බව අනාවරණය විය යුතු ය. ලියා ඇති පිළිතුර සැලකිල්ලට යොමු කර ලකුණු දෙන්න. **(ලකුණු 08 යි)**

03.

(i) චතු-අරියසච්ච (චතුරාර්ය සත්‍යය)

පටිච්ච සමුප්පදාය (ප්‍රතීත්‍ය සමුප්පාදය)

(එක් සංකල්පයකට ලකුණු 02 බැගින් සංකල්ප දෙකට ලකුණු 04යි)

(ii) දුක්ඛ, සමුදය, නිරෝධ, මාර්ග යනු චතුර්ය සත්‍යයි. බුදු, පසේ බුදු, මහරහත් උතුමන් විසින් අවබෝධ කළ හෙයින් මේ ධර්මය ආර්ය සත්‍ය නම් වේ.

අවිද්‍යා ප්‍රත්‍යයෙන් (හේතුවෙන්) සංස්කාරයෝ වෙති. ආදී වශයෙන් හේතුව හා ඵලය දක්වන න්‍යාය පටිච්ච සමුප්පාදයයි. තවදුරටත් දක්වහොත් ඵලයන්ගේ පැවැත්මට, නිපදවීමට මෙහෙයවීමට අවශ්‍ය කරුණු සමූහය පටිච්චසමුප්පාදයයි. මෙම ධර්මය බුදුරජාණන් වහන්සේ විසින් සම්මා සම්බුදු බවට පැමිණ බෝරුක් මුල සතියක් වැඩසිට සත්වන දින රෑ තුන් යාමයට අනුලෝම, පටිලෝම වශයෙන් මෙනෙහි කළ සේක.

(ලකුණු 03 බැගින් ලකුණු 06යි)

(iii) සතුටින්, සුවයෙන් වාසය කිරීම බුදුදහම අවධාරණය කෙරේ. මේ සඳහා සන්තුට්ඨි, සුබ ආදී වචන දේශනාවේ සඳහන් වේ. ගිහි සැප, පැවිදි සැප වශයෙන් ප්‍රභේද කොට දක්වන්නා වූ මේ සැපයේදී රහත්භාවය උතුම්ම සැපය ලෙස බුදුරජාණන් වහන්සේ දේශනා කර ඇත. වය අවේදයිත සැපය වශයෙන් ද පෙන්වා ඇත. "සුඛා විරාගා ලෝකේ" "නත්ථි සන්ති පරං සුඛං, නිබ්බානං පරමං සුඛං, සුඛ මිදං ආවුසෝ නිබ්බානං" මෙම දේශනා පාඨයන්ගෙන් නිවන පරම සැපය වන බව පෙන්වා දී ඇත.

(සාර්ථක පිළිතුරකට ලකුණු 08යි)

04.

(i) නැති නොවන, වෙනස් නොවන යම් දෙයක් මිනිසා තුළ ඇතැයි යන විශ්වාසය ආත්ම වාදයයි. දඹදිව පැවති බොහෝ ආගම්වල මෙම ලක්ෂණය විදා දක්නට ලැබුණි. මෙය ජාතියෙන් ජාතියට ගමන් කර, ආත්මය සම්පූර්ණයෙන් පිරිසිදු වූ පසු බ්‍රහ්මන් හෙවත් පරමාත්මයට එක් වෙයි. බුදු සමය නිත්‍ය සදාකාලික ආත්මයක් නොපිළිගනී. පංචස්කන්ධය, පටිච්ච සමුප්පාද දර්ශනය යන ඉගැන්වීම් නොවෙනස්වන ආත්මයක් නැතැයි පිළිගන්නා බුදුසමය අනාත්තවාදය තහවුරු කරයි.

ආත්මවාදය සහ උච්ඡේද වාදවල තදින් ගනිමින් කටයුතු කිරීම බුදුසමය ප්‍රතික්ෂේප කරන අතර වය අන්තවාදයක් සේ හඳුනා ගනී.

(එක් වාදයක් පැහැදිලි කිරීමට ලකුණු 02 බැගින් වාද දෙකටම ලකුණු 04යි)

(ii) රූප, වේදනා, සඤ්ඤා, සංඛාර, විඤ්ඤාණ ස්කන්ධ පහ අඩුවක් නැතිව තිබිය යුතුය.

(ලකුණු 06යි)

(iii) රූප ස්කන්ධය රූප ගොඩට ද අනෙක් ස්කන්ධ හතර නාම කොටසට ද වැටේ.

නාමයට (4) රූපයට (4)

(ලකුණු 08යි)

05.

(i) සති, ධම්මවිචය, විරිය, පීති, පස්සද්ධි, සමාධි, උපෙක්ඛා

1 - (1) 6 - 3
4 - (2) (7) - 4

(ලකුණු 04යි)

(ii)

සතිය	-	කුසල සිත්හි එලඹ සිටි සිහිය
ධම්මවිචය	-	මනසෙහි ඇතිවන ධර්ම පරීක්ෂා කිරීම
විරිය	-	කුසලයෙහි උත්සාහය
පීති	-	කුසලය තුළින් ඇතිවන ප්‍රීතිය
පස්සද්ධි	-	සමාධිය කෙරෙන් ඇතිවන ශාරීරික මානසික සැහැල්ලු බව
සමාධි	-	කුසල සිත්හි එකඟ බව
උපෙක්ඛා	-	සිතේ ඇතිවන මධ්‍යස්ථ ස්වභාවය

(එක් කරුණකට ලකුණු එක බැගින් ලකුණු 06යි)

(iii) බෝධිය නම් චතුරාර්ය සත්‍ය අවබෝධයයි. එහි අංග බොජ්ඣංග නම් වේ. එහි සඳහන් වන සති,විරිය ආදිය කවර පාර්ශවයකට නමුත් සිය සිත්හි පහළකර ගෙන ලෞකික, ලෝකෝත්තර උභයාර්ථය සාධනය කර ගත හැක. ලෞකික ජීවිතයේදී (ගිහි) ඊට අදාළව ද ලෝකෝත්තර ජීවිතයේදී (පැවිදි) ඊට අනුරූපීව ද මේ ධර්ම සහ ප්‍රගුණ කළ හැකි බව පිළිතුරෙන් පෙන්වා දිය යුතු ය.

(ලකුණු 08යි)

06.

(i) සක්කායදිට්ඨි, විචිකිච්ඡා, සීලබ්බත පරාමාස, කාමරාග, පටිඝ, රූප රාග, අරූප රාග, මාන, උද්ධච්ච, අවිජ්ජා

1 - (1)
6 - (2)
8 - (3)
10 - (4)

(ලකුණු 04යි)

කරුණු 5කට ලකුණු 01යි

කරුණු 6-7 ලකුණු 02යි

කරුණු 8-9 ලකුණු 03යි

කරුණු 10කට ලකුණු 04යි

(ii)

සක්කාය දිට්ඨි	-	මමය මගේය යන දෘෂ්ටිය
විචිකිච්ඡා	-	බුද්ධාදි අවතන්හි සැකය
සීලබ්බත පරාමාස	-	ශීල හා ව්‍රත කෙරෙහි දැඩි බැඳීම
පටිඝ	-	සිතෙහි ඇති ද්වේෂ සහගත බව
කාම රාග	-	කාම වස්තු කෙරෙහි ඇති බැඳීම

PAST PAPERS WIKI

රූප රාග	-	රූපී තත්වය කෙරෙහි ඇති බැඳීම
අරූප රාග	-	අරූප තත්වය කෙරෙහි ඇති බැඳීම
මාන	-	සිතෙහි උඩඟු බව
උද්ධච්ච	-	සිතෙහි විසිරුණු ගතිය
අවිජ්ජා	-	චතුරාර්ය සත්‍ය නොදැනීම

එක් කරුණකට ලකුණු දෙකකි.

(ලකුණු 06යි)

(ii) ප්‍රථම තුන සෝවාන් මාර්ගයෙන් නැතිවේ. රිළඟ දෙක සකෘදාගාමී මාර්ගයෙන් තුනී වී අනාගාමී මාර්ගයෙන් නැති වේ. අවසන් පහ අරහත් මාර්ගයෙන් නැති වේ.

(සෝවාන් මාර්ගයෙන් නැතිවන සංයෝජන දැක්වීමට ලකුණු 02යි. සකෘදාගාමී මාර්ගයෙන් නැතිවන හා අනාගාමී මාර්ගයෙන් නැතිවෙන සංයෝජන දැක්වීමට ලකුණු 02යි. අරහත් මාර්ගයෙන් නැතිවන සංයෝජන ධර්ම දැක්වීමට ලකුණු 04යි.)

07.

(i) (අ) අනිච්ච, දුක්ඛ, අනාත්ත

කරුණු තුනම නිවැරදි යි.

(ලකුණු 02යි)

(ආ)

අනිච්ච	-	වෙනස්වීම
දුක්ඛ	-	දුක් සහගත බව
අනාත්ම	-	මමය මාගේය යනුවෙන් ඇති යමක් නැති බව

උදාහරණවට (2) - (1)

(ලකුණු 02 යි)

(ii) විදර්ශනා භාවනාව / ප්‍රඥා භාවනාව (2)

(ලකුණු 02යි)

(iii) පුද්ගලයා හැමවිටම සියලු දේපල වස්තුව පමණක් නොව තමාගේ ශරීර ඉන්ද්‍රියන් ආදිය පවා වෙනස් වෙනවාට කැමති නැත. එහෙත් ත්‍රිලක්ෂණ ධර්මය නිසි ලෙස වටහාගත් කල්හි ඒ සියලු වෙනස්වීම්වලින් නොසැලී සිටීමට හැකිවෙයි. මෙවැනි පිළිතුරක් අපේක්ෂිතය.

(ලකුණු 08යි)

වලිතිකා ඇඳිබෙදුම අනාත්ම ඇති කරුණෙන් දැනීම

ආදාන් ඇල්ලීම දැනීම. උදාහරණවට (4)

*****

PAST PAPERS WIKI

WWW.PastPapers.WiKi

Downloaded From Past Papers WiKi - Sri Lanka's Largest Past Papers Library